# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2447/15 - 2025 ජූලි මස 29 වැනි අඟහරුවාදා - 2025.07.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය**

මෙම QR කේතය Scan කර ලියාපදිංචි තොරතුරු බලාගත හැක. නැතිනම් ec.lk/vrd අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව
2025(1), 2025(2) සහ 2025(3) පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය, හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදනය

*අර්ථ දැක්වීම*

01\. "පනත" - 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ ( සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත

02\. "පරිපූරක ලැයිස්තු" - 2025 පෙබරවාරි මස 01 දින සිට 2025 මැයි මස 31 දින දක්වා කාල සීමාව ඇතුළත යම් දිනයකදී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන

(එනම් 2007.02.01 සිට 2007.05.31 දක්වා උපත ලද) හා 2025(1) පරිපූරක ඡන්ද හිමි නාමලේඛනය සඳහා නිර්දේශිත තැනැත්තන්ගේ නම් සඳහන් වන ලැයිස්තුව.

2025 ජුනි මස 01 දින සිට 2025 සැප්තැම්බර් මස 30 දින දක්වා කාල සීමාව ඇතුළත යම් දිනයකදී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(එනම් 2007.06.01 සිට 2007.09.30 දක්වා උපත ලද) හා 2025(2) පරිපූරක ඡන්ද හිමි නාමලේඛනය සඳහා නිර්දේශිත තැනැත්තන්ගේ නම් සඳහන් වන ලැයිස්තුව.

2025 ඔක්තෝබර් මස 01 දින සිට 2026 ජනවාරි මස 31 දින දක්වා කාල සීමාව ඇතුළත යම් දිනයකදී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන

(එනම් 2007.10.01 සිට 2008.01.31 දක්වා උපත ලද) හා 2025(3) පරිපූරක ඡන්ද හිමි නාමලේඛනය සඳහා නිර්දේශිත තැනැත්තන්ගේ නම් සඳහන් වන ලැයිස්තුව.

*පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන*

| ප්‍රදර්ශනය පිණිස තබනු ලබන ස්ථානය | ප්‍රදර්ශනය පිණිස තබා ඇති ලැයිස්තු හෝ ඒවායේ කොටස් |
|---|---|
| 01. එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | අදාළ මැතිවරණ කොට්ඨාසයෙහි පරිපූරක ලැයිස්තු සම්පූර්ණ පිටපත |
| 02. එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියළුම ඡන්ද කොට්ඨාස දැක්වෙන පරිපූරක ලැයිස්තු කොටසෙහි පිටපතක් |
| 03. එක් එක් පළාත් පාලන ආයතනය | අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියළුම ඡන්ද කොට්ඨාස දැක්වෙන පරිපූරක ලැයිස්තු කොටසෙහි පිටපතක් |
| 04. එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය | අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටා ඇති සියළුම ඡන්ද කොට්ඨාස දැක්වෙන පරිපූරක ලැයිස්තු කොටසෙහි පිටපතක් |

*උපදෙස්*

01. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 20අ(5) උප වගන්තිය අනුව 2025(1), 2025(2) සහ 2025(3) පරිපූරක ලැයිස්තු පිළියෙල කර අවසන් බව හා එම ලැයිස්තු හෝ ඒවායේ කොටස් කාර්යාල වේලාවන් හි දී ඉහත සඳහන් ප්‍රදර්ශන ස්ථානයන්හි දී මහජනයාට පරීක්ෂා කිරීම පිණිස තබා ඇති බවත්; මෙහි පහත උපලේඛනයෙහි I වන තීරයෙහි සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා එහි II වන තීරයෙහි අනුරූප සටහනේ සඳහන් සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී විසින් 2025.07.29 දින පරිපූරක ලැයිස්තු සම්පූර්ණ කර ඇති බවත්; ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 20අ(5) උප වගන්තිය යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙනුවෙන් දැනුම් දෙනු ලැබේ.

02. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අනුකූලව 2025.05.31 දිනට, 2025.09.30 දිනට හා 2026.01.31 දිනට අටලොස් විය සම්පූර්ණ වන එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තාවූ එහෙත් පරිපූරක ලැයිස්තුවට ඇතුළත් කර නොමැති යම්කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උප ලේඛනයේ නියම කර ඇති "අ" සහ "ආ"ආකෘතියට සාරානුකූලව හෝ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා හඳුන්වා දී ඇති YC ආකෘතියක් මගින් උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සමග 2025 ජූලි මස 29 දින සිට දින 10 ක් ඇතුළත එනම් 2025 අගෝස්තු 07 දින හෝ ඊට පෙර මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරී (දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය) වෙත ලැබිය යුතුය.

03. මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තාවූ යම් කෙනෙකුට; තමාගේ නම හෝ එකී ලැයිස්තුවේ නම සඳහන් වී ඇත්තාවූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවන් යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඇ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පරිපූරක නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට එනම් 2025 ජූලි මස 29 දින සිට දින 10ක් ඇතුළත එනම් 2025 අගෝස්තු මස 07 දින හෝ ඊට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතුය.

04. හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවයක්ම හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට දින 7 ක් ඇතුළත යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි 'ඇ' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම දැන්වීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2025 අගෝස්තු මස 11 වන දින ප්‍රසිද්ධ කරනු ඇත.

05. හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'අ' 'ආ' YC ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'ඇ' 'ඈ' ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ පළාත් පාලන ආයතන කාර්යාල හෝ ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගත හැකිය.

**ආර්.එම්.ඒ.එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

2025 ජූලි මස 29 වැනි දින.
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| ***I* වන තීරය** *මැතිවරණ කොට්ඨාසය* | ***II* වන තීරය** ***2025(1), 2025(2), 2025(3)*** *පරිපූරක ලැයිස්තු සකස් කළ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී* | ***I* වන තීරය** *මැතිවරණ කොට්ඨාසය* | ***II* වන තීරය** ***2025(1), 2025(2), 2025(3)*** *පරිපූරක ලැයිස්තු සකස් කළ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී* |
|---|---|---|---|
| **01.** කොළඹ | පී.රගුනාදන් | **12.** මඩකලපුව | එම්. බී. එම්. සුපියාන් |
| **02.** ගම්පහ | ඩබ්ලිව්. ඒ. රවින්ද්‍ර වික්‍රමසිංහ | **13.** දිගාමඩුල්ල | කසුන් ශ්‍රීනාත් අත්තනායක |
| **03.** කළුතර | කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු | **14.** ත්‍රිකුණාමලය | එස්.කේ. දේවනෙරංජන් |
| **04.** මහනුවර | එච්.ඩී.එන්. සම්පත් ප්‍රනාන්දු | **15.** කුරුණෑගල | ආර්.එම්.එච්.බී. රත්නායක |
| **05.** මාතලේ | එච්.ඒ.ඊ. පුෂ්පකුමාර | **16.** පුත්තලම | එස්.එල්.ආර්. ජයනායක |
| **06.** නුවරඑළිය | කේ.ඒ.එල්.එස්.කලුගම්පිටිය | **17.** අනුරාධපුරය | එන්.පී.පී.අයි.ආර්. ගුණරත්න |
| **07.** ගාල්ල | ඩබ්ලිව්.එච්.ආර්. විජය කුමාර | **18.** පොළොන්නරුව | මනෝජ් ටී. ගුරුසිංහ |
| **08.** මාතර | පී.එස්. පතිරණ | **19.** බදුල්ල | කේ. කාන්දීපන් |
| **09.** හම්බන්තොට | වී.ඩී.ජේ. ලක්මාල් | **20.** මොණරාගල | එන්. රේගන් |
| **10.** යාපනය | ආර්. සසීලන් | **21.** රත්නපුර | සුරංග අඹගහතැන්නෙ |
| **11.** වන්නි | ආර්.සී. අමල්රාජ් | **22.** කෑගල්ල | සජිත් පී. කස්තුරිසිංහ |

EOG 07 - 0338